**ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ අදියර 1 බී ව්‍යාපෘතිය- 2014**

---------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ අදියර 1 බී ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල අතර 2011 දෙසැම්බර් 20 දින එළඹි අංක 836 දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රාදේශීය හා ජාතික අවශ්‍යතා අග්නිදිග විශ්වවිද්‍යාලයෙන් පිළිබිඹු වන පරිදි උපාධි පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මෙන්ම සුදුසු අධ්‍යාපන සංවර්ධන සැලැස්ම හා නව අවශ්‍යතාවයන්ට සරිලන උපාධි වැඩසටහන් වැඩි දියුණු කිරීම තුළින් හා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනයට හා ආර්ථික වර්ධනයට උපකාරී වීමට ශ්‍රී ලංකාවේ අම්පාර දිස්ත්‍රික්කයේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. සංවර්ධන සැලැස්මෙන් ප්‍රධාන වශයෙන්, නව පීඨ ගොඩනැගිලි හා පුස්තකාල හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම, ශිෂ්‍ය හා ආචාර්ය මණ්ඩල නවාතැන් පහසුකම් වැඩි දියුණු කිරීම, විනෝද හා සුභසාධක පහසුකම් සැපයීම සිදුකරනු ලැබේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු. මිලියන 1,660 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 3.5 කි. ඉන් රු. මිලියන 1,421 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 3ක් අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 සැප්තැම්බර් 01 දින ආරම්භ කළ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීමකි.

**1.4 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව්කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩි දියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව , සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදල් වල අයවැයගත ප්‍රතිපාදන, උපයෝජනය සහ 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය සම්බන්ධයෙන් වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| අරමුදල් ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2014 සඳහා අයවැය ගත ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | කුවේට් ඩිනාර් මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු. මිලියන |
| කුවේට් අරමුදල | 3.00 | 1,421.57 | 230.00 | 219.55 | 0.51 | 240.07 |
| ශ්‍රී ලංකා රජය | 0.50 | 238.48 | 37.00 | 34.07 | 0.09 | 43.50 |
| එකතුව | 3.50 | 1,660.05 | 267.00 | 253.62 | 0.60 | 283.57 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ වෙන්කරන ලද සම්පත් උපයෝගී කරගෙන ව්‍යාපෘති අරමුණු ඉටු කරගැනීම සහතික වීම සඳහා සම්පූර්ණ ව්‍යාපෘති කාල සීමාවට අදාලව එහි මූල්‍යමය හා භෞතික ඉලක්ක සමඟ එහි වගකීම් තීරණය වන ආකාරයට මාසිකව, කාර්තුමය, අර්ධ වාර්ෂිකව වශයෙන් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ii) ඉහත තොරතුරු අනුව ව්‍යාපෘති කාලයෙන් සියයට 70 ක් ගෙවීගියද ව්‍යාපෘතිය සඳහා වෙන්කළ අරමුදල්වලින් සියයට 17ක් පමණක් උපයෝජනය කර තිබුණු බැවින් කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක නොකළහොත් අදාල කාලපරිච්ජේදය තුළදී ව්‍යාපෘති කාර්යයන් ඉටුකර ගත නොහැකි වනු ඇත.

**3.2 භෞතික ප්‍රගතිය**

**-------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාලය වර්ෂයක් තුළ අවසන් කිරීමට නියමිත වුවද සිවිල් ඉදිකිරීම් 5 ක භෞතික ප්‍රගතිය 2015 මාර්තු 31 දිනට සියයට 16 සිට සියයට 40 දක්වා අඩු ප්‍රගතියක් පෙන්නුම් කෙරේ. විස්තර පහත දැක්වේ.

2015 මාර්තු 31 දිනට

| විස්තරය | ඇස්තමේන්තු ගත පිරිවැය | දැරූ වියදම | මූල්‍ය කාර්ය සාධනය | භෞතික කාර්ය සාධනය |
|---|---|---|---|---|
| | රු. | රු. | % | % |
| ශිෂ්‍ය නේවාසිකාගාරය - ඔලුවිල් | 263,886,709 | 105,835,943 | 40 | 32 |
| ශිෂ්‍ය නේවාසිකාගාරය- සමන්තුරේ | 117,558,557 | 41,135,791 | 35 | 30 |
| අධ්‍යයන වැඩසටහන් මධ්‍යස්ථානය | 64,850,953 | 26,929,975 | 42 | 40 |
| ජල විද්‍යා පරීක්ෂණාගාරය | 263,334,385 | 62,453,725 | 24 | 16 |
| කාර්යය මණ්ඩල නිල නිවාස | 173,129,132 | 42,048,669 | 24 | 16 |

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට විදේශීය හා දේශීය උපදේශන ගාස්තු එකතුව රු. මිලියන 5.91 ක් සැලසුම් කටයුතු සඳහා වැය කර තිබූ නමුත්, පොදු ආපනශාලාව, ක්‍රීඩා පිටිය හා ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් 2015 මාර්තු 31 දින දක්වා ආරම්භ කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

**--------------------------------**

ව්‍යාපෘති ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු නමුත් 2014 අප්‍රේල් 28 සිට 2014 මැයි 07 දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවැත්වූ සමුළුවකට සහභාගි වීමට ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙනුවෙන් රු. මිලියන එකක් ගමන් වියදම් හා සංයුක්ත දීමනා වශයෙන් ව්‍යාපෘතිය විසින් වැය කර තිබුණි.